Department of Education, Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති

ඉතිහාසය වසර අවසාන පුණරීක්ෂණය 2

3 වාරය සතිය _ 15

ශ්‍රේණිය : 6

සකස් කිරීම - මාවනැල්ල කලාපයල

පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

(01) (i) පහත වරහන් තුළ දී ඇති තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් පාසලේ ඉතිහාසය හැදෑරීමට වැදගත් වන මූලාශ්‍ර තුනක් ලියන්න. (ලකුණු 3)

(ජාතක කථා, ඡන්ද නාම ලේඛනය, ලොග් සටහන් පොත, වංස කථා, විදුහල්පති නාමාවලිය, සිසුන් ඇතුළත් වීමේ නාම ලේඛනය)

(ii) ක්‍රි. ව. හා බු. ව. පිළිබඳ ඔබගේ දැනුම භාවිතා කර පහත වගුව පුරවන්න.

| | ක්‍රි. ව. | බු. ව. |
|---|---|---|
| ඔබ උපන් වර්ෂය | ..................... | ..................... |
| වර්තමාන වර්ෂය | ..................... | ..................... |

(ලකුණු 4)

(iii) පහත වචන සටහන උදව්කරගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නෙ | බි | යු | ලා | ව | ශා | ක |
| ඔ | ප්‍රො | කා | යෝ | ට් | ලා | වා |
| ප | පෙ | ලි | යෝ | සො | යි | ක |
| බි | සි | ලූ | රි | ය | න් | හා |
| නි | මැ | ම | ත් | අ | ලි | ශා |
| යා | තා | ක් | ෂ | ණ | ය | ව |
| හැ | ක | ර | ල් | ල | න් | ය |

(අ) පෘථිවිය නිර්මාණය වීමට හේතු කාරක වූවා යැයි සලකන දූවිලි වලාව හඳුන්වන නම
(ලකුණු 1)

(ආ) කැනඩාවෙන් හමු වී ඇති පාෂාණ භූත සලකුණ හඳුන්වන නම (ලකුණු 1)

(ඇ) මිනිසා සතු නොයෙක් නොයෙක් දේ තැනීමේ හැකියාව හඳුන්වන නම (ලකුණු 1)

(ඈ) පෘථිවිය උතුරු දකුණු ප්‍රදේශ හිමවලින් වැසී ගිය යුගයේ බිහි වූ සත්ත්ව වර්ගය (ලකුණු 1)

(02) (i) මිනිසා භාවිත කළ ගල් මෙවලම්වල ස්වරූපය අනුව ඔවුන්ගේ සංස්කෘතික දියුණුව බෙදෙන ප්‍රධාන අවධි 03 නම් කරන්න.
(ලකුණු 3)

(ii) පහත සඳහන් වන්නේ විවිධ සංස්කෘතික අවධිවල ජීවත් වූ මිනිසුන් සතුව පැවති හැකියා කිහිපයකි. ඒවා අතරින් මධ්‍ය ශිලා යුගයේ පුද්ගලයා සතු හැකියා 04ක් තෝරන්න. (ලකුණු 4)

A - දුනු ඊතල භාවිත කර දඩයම් කිරීම ආරම්භ කිරීම.

B - ගල් මෙවලම් වෙනුවට ලෝහ ආයුධ සොයා ගැනීම.

C - එක තැනක ජීවත්වීමට හුරු වීම.

D - ආගමික කටයුතුවලට නැඹුරු වීම.

E - දැව දඬු කොළ අතු භාවිත කර නිවාස සෑදීම.

F - සතුන්ගේ ආරක්ෂාව පතා දෙවියන් ඇදහීම.

G - ගල් පර්වත බිත්ති මත චිත්‍ර ඇ දීම.

(iii) අප අද ආහාරයට ගන්නා ධාන්‍ය වර්ග කිහිපයක ආරම්භය සිදු වූ ආකාරය අනුව පහත වගුවේ හිස්තැන් පුරවන්න. (ලකුණු 4)


| රට | ධාන්‍ය වර්ගය | කාලය |
|---|---|---|
| 1. ...................... | බඩ ඉරිඟු | ක්‍රි. පූ. 3000 |
| මධ්‍යධරණී ප්‍රදේශ | 2. ...................... | 3. ...................... |
| චීනය | 4. ...................... | ක්‍රි. පූ. 7000 |

(03) (i) චීන ශිෂ්ටාචාරය විසින් ලෝකයට හඳුන්වා දුන් දේවල් 03ක් නම් කරන්න. (ලකුණු 3)

(ii) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බිහි වූ නගර හොඳින් සැලසුම් කරන ලද ඒවා ය. එම ශිෂ්ටාචාරයට අයත් එලෙස සැලසුම් කරන ලද නගර 4ක් නම් කරන්න. (ලකුණු 4)

(iii) පහත දී ඇති තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් රූප සටහන සම්පූර්ණ කරන්න.

* මම්කරණය ලොවට හඳුන්වා දීම.
* ලෝකයේ පැරණිම වීර කතාව ලිවීම
* අපද්‍රව්‍ය බැහැර කරන නළ පද්ධති ඉදි කිරීම.
* චිත්‍රාක්ෂර භාවිත කිරීම.
* තඹ ලෝහ ඒයම් භාවිත කිරීම.



(05) (i) පහත සඳහන් ජනාවාස පිහිටුවා ගත් විජය කුමරුගේ ඇමතිවරු සඳහන් කරන්න. (ලකුණු 3)

1. අනුරාධගාම - ..........................................
2. උපතිස්සගාම - ..........................................
3. දීඝගාම - ..........................................

(ii) ඔබ ලංකා ඉතිහාසය ඉගෙනීමේ දී දැන ගත් ඓතිහාසික තොරතුරු කිහිපයක් පහත දැක්වේ. ඒවා අනුපිළිවෙළට සකස් කර ලියන්න.

A - අට සැට ලෙන් පූජා කිරීම.

B - රුවන්වැලි සෑය ඉදි කිරීම

C - ජය ශ්‍රී මහා බෝධිය වැඩම කිරීම.

D - ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම.

E - විජය කුමරු ලංකාවට පැමිණීම.

F - මින්නේරිය වැව ඉදි කිරීම.

G - එළාර රජු අනුරාධපුරය යටත් කිරීම.

H - අභය වැව ඉදි කිරීම.
(ලකුණු 8)

(06) (i) එළාර රජු පරාජය කිරීමට ගිය ගමනේ දී දුටුගැමුණු කුමරුට උදවු කළ දක්ෂ බුද්ධිමත් සෙන්පතිවරු තිදෙනෙක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත සඳහන් ප්‍රකාශ හා සම්බන්ධ පිළිතුර සපයන්න.

A - වළගම්බා රාජ සමයේ ඇති වූ සාගතය හැඳින් වූ නම ..........................

B - දුටුගැමුණු රජතුමා අනුරාධපුරය බේරාගැනීමේ දී සහය වූ ඇතා ..........................

C - ශ්‍රී ලංකාව් මෙහෙණි සසුන ආරම්භ කිරීමට දායක වූ බිසව ..........................

D - සමස්ත ලෝකයේ ඉදි වූ විශාලතම ගඩොල් ස්තූපය ලෙස සැලකෙන්නේ ..........................

(iii) ලංකා ඉතිහාසයේ විශිෂ්ට සේවාවක් කළ චරිතවල තිබූ උසස් ගුණාංග කිහිපයක් පහත දැක්වේ. එම ගුණාංගවලට සම්බන්ධ රජු ඉදිරියෙන් ලියා දක්වන්න. (ලකුණු 4)

A - බුද්ධිමත්ව කටයුතු කර ජයග්‍රහණය කිරීම හා ගරු කළ යුත්තන්ට ගරු කිරීම.

B - නොයෙක් බාධක හමුවේ ඉවසිලිවන්තව කටයුතු කිරීම.

C - ධෛර්‍යවන්තව දුර දක්නා නුවණින් හා විමසිලිමත් භාවයෙන් කටයුතු කිරීම.

D - තම රටවැසියා වෙනුවෙන් වෙහෙස වී වැඩ කිරීම.